# මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
# நிதி, திட்டமிடல் அமைச்சு
# MINISTRY OF FINANCE AND PLANNING

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01. Sri Lanka

| | | |
|---|---|---|
| කාර්යාලය / அலுவலகம் / Office: 2484500, 2484600, 2484700 | ෆැක්ස් / பெக்ஸ் / Fax: (94) - 11 - 2449823 | වෙබ් අඩවිය / வெப்சைட் / Website: www.treasury.gov.lk |


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. පීඑෆ් /එෆ්එස්/01 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2008.12. 31 |

රාජ්‍ය මුදල් චක්‍රලේඛ: අංක. 434

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,

පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,

දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන්,

පළාත් පාලන ආයතනවල ප්‍රධානීන් සහ

රාජ්‍ය සංස්ථා,මණ්ඩල,අධිකාරී සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සභාපතිවරුන් වෙත.

<u>පළාත් සභා, පළාත් පාලන ආයතන හා භාණ්ඩාගාරයේ මූල්‍යාධාර මත යැපෙන ව්‍යවස්ථාපිත ආයතන වෙත ගාස්තු අයකිරීමකින් තොරව තක්සේරු සේවා සැපයීම</u>

පළාත් සභා,පළාත් පාලන ආයතන,රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතන විසින් රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලබා ගන්නා සේවා සඳහා තක්සේරු සේවා ගාස්තු ගෙවීමට හැකියාවක් නොමැතිවීම හේතුවෙන් එකී ආයතන මුහුණ දෙන විවිධ දුෂ්කරතා සහ එම තක්සේරු කාර්යයන් මගින් අපේක්ෂිත වූ අරමුණු ඉටුකර ගැනීමට නොහැකිවීම යන කරුණු කෙරෙහි අවධානය යොමු කළ අමාත්‍ය මණ්ඩලය පහත සඳහන් පරිදි ක්‍රියා කිරීමට 2008.09.17 දින අනුමැතිය දී ඇත.

(අ) මින් ඉදිරියට පළාත් සභා, පළාත් පාලන ආයතන සහ මහා භාණ්ඩාගාරයේ මූල්‍යාධාර මත යැපෙන රාජ්‍ය සංස්ථා, මණ්ඩල හා ව්‍යවස්ථාපිත ආයතන වෙත අවශ්‍ය තක්සේරු සේවාවන් රජයේ තක්සේරුකරු විසින් ගාස්තු අයකිරීමකින් තොරව සිදු කිරීම.

(ආ) ඉහත (අ) හි සඳහන් ආයතන වෙතින් තක්සේරු දෙපාර්තමේන්තුවට අයවිය යුතුව ඇති හිඟ තක්සේරු ගාස්තු අයකිරීම අත්හැරීම.

(ඇ)මහා භාණ්ඩාගාරයේ මූල්‍යාධාර මත නොයැපෙන රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, රාජ්‍ය බැංකු සහ වෙනත් ව්‍යවස්ථාපිත ආයතන වෙත සපයනු ලබන තක්සේරු සේවාවන් සඳහා මහා භාණ්ඩාගාරයේ එකඟතාවය මත නිශ්චය කරනු ලබන තක්සේරු ගාස්තුවක් අයකිරීම.

02. තක්සේරු ගාස්තු ගෙවීම සඳහා ප්‍රමාණවත් මූල්‍ය ප්‍රතිපාදන නොමැතිවීම හේතුවෙන් දැනට නැවතී ඇති තක්සේරු කාර්යයන් අප්‍රමාදව රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව වෙතින් ඉටුකරවා ගැනීමටත්, එමගින් තම ආදායම් වර්ධනය කර ගැනීමටත් ඉහත (අ) ඡේදයේ සඳහන් ආයතන ප්‍රධානීන් කටයුතු කළ යුතු බව කාරුණිකව දන්වමි.

03 ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසිවල අදාල ඡේදයන් හා තක්සේරු කටයුතු සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛයන් ඉහත අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි සංශෝධනය කෙරෙනු ඇත.

**එස්.අබේසිංහ**

**භාණ්ඩාගාරයේ ලේකම්**

පිටපත් :

1. ලේකම්,රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
2. විගණකාධිපති
3. ප්‍රධාන තක්සේරුකරු
4. ආයතන අධ්‍යක්ෂ ජනරාල්.